# ග්‍රාම සංවර්ධන සැලැස්ම
# Village Development Plan



**කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

**ග්‍රාම නිලධාරි වසම - හොරතුඩුව කෝද්දූරාව 571A**

| | |
|---|---|
| ග්‍රාම නිලධාරි වසම සහ අංකය | - **571/A** හොරතුඩුව |
| **Name of GN Division and Number** | - |
| වසමේ ස්වභාවය (ග්‍රාමීය, වතු, නාගරික) | - ග්‍රාමීය |
| **Nature of the GN Division (Rural, Estate,Urban)** | - |
| වසමෙහි ඇතුළත් ගම්මාන සංඛ්‍යාව සහ ඒවායේ නම් | - 2 හොරතුඩුව , කෝදුරාව |
| **Number of Villages and their Names** | - |
| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | - කැස්බෑව |
| **Divisional Secretariet** | - |
| දිස්ත්‍රික්කය | - කොළඹ |
| **District** | - |

| සකස්කළේ | නිර්දේශය | අනුමැතිය |
|---|---|---|
| ...................................... | ...................................... | ...................................... |

## 1. ක්‍රමවේදය - Methodology

(ග්‍රාමීය ප්‍රජාවද ඇතුළත්ව වසමේ සියලු පාර්ශවයන්ගේ අදහස් නියෝජනය වන ක්‍රමවේදයක් අනුගමනය කල යුතුය/ A methodology which represents idias and suggestions of all stakehoders including village community)

### 1.1 අරමුණු - Objectives

• වඩා යහපත් ජීවන තත්ත්වයක් ඇති කිරීම සඳහා ග්‍රාමීය ප්‍රජාවගේ ආදායම් මට්ටම ඉහළ නැන්වීම.

• ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම.

• සමාජ සංවර්ධනය මගින් සමාජ ගැටලු අවම කිරීම.

• මූලික පහසුකම් (යටිතල පහසුකම් හා සේවා ) උදෙසා වන ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම.

• තිරසාර සංවර්ධනය සඳහා පරිසරය සංරක්ෂණය කිරීම. .

### 1.2 සහභාගිත්ව පාර්ශවයන් - Stakeholders involved

• වසමේ සේවය කරන රාජ්‍ය නිළධාරීන්

• ස්වෙච්ඡා සංවිධාන වල නිළධාරීන්

• ග්‍රාමීය ප්‍රජාව

• දේශපාලන අධිකාරිය සහ ප්‍රජා නායකයින්

## 2. වසමේ පිහිටීම හා භූමි ප්‍රමාණය - Land Extend and the Location of GN Division

• කොළඹ දිස්ත්‍රික්කයේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හෙක්ටයාර 46 භූමි ප්‍රමාණයකින් යුක්ත ග්‍රාම නිළධාරි වසමකි.කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෙළවරක පිහිටි ඉතා කුඩා ගමකි.උතුරින් එළම්බු ඇළෙන්ද දකුණින් හල්පිට ග්‍රාම නිළධාරී වසමෙන්ද,නැගෙනහිර පොල්ගස්ඕවිට මංසන්දිය අසල ඇති එළම්බු ඇළෙන්ද,බටහිරින් හොන්නන්තර ග්‍රාම නිළධාරී වසමෙන්ද මායිම්ව පිහිටා තිබේ.

• 1970 දශකයේ හල්පිට හා හොරතුඩුව එකම ග්‍රාම නිළධාරී වසමක් ලෙස පැවත තිබේ.පසු කාලයේදී එය හල්පිටින් වෙන්ව හොරතුඩුව කෝදූරාව නමින් වෙනම ග්‍රාම නිළධාරී වසමක් බවට පත්ව තිබේ.වර්තමානය වන විට මෙය හොරතුඩුව ග්‍රාම නිළධාරී වසම බවට පත්ව තිබේ.

**3.වසමේ සිතියම - GN Division Map**



**4. වසමේ හරස්කඩ චාරිකාව - Cross Section of the GN Division**

(වසමේ ස්වාභාවික සහ භෞතික සම්පත්, ජනාවාසකරණය, ඉඩම් පරිහරණය, යටිතල පහසුකම් සහ ගැටළු ආදිය හඳුනාගත යුතුය/ Natural and physical resources, habitation, land use pattern, infrastructure and issues ect.should be identified)

• හොරතුඩුව ග්‍රාම නිළධාරී වසම කෙළවරකින් ඉතා රමණීය වෙල් යායකින් වටවී ඇති ග්‍රාමීය ජීවන රටාවකට හිමිකම් කියනු ලබන ඉතා සුන්දර ගම්මානයකි.ගම කෙළවරින් ගලා බසිනා ඉතා සුන්දර ඇළ මාර්ගයක්ද ගම සතු වේ.අක්කර 63 රූඩ් 4 කින් යුත් කුඹුරු යායක්ද ඇත.එයින් අක්කර 15 පමණ ප්‍රමාණයක් පුරන් කුඹුරු වේ.මෙම කුඹුරු නැවත අස්වැද්දීම ගොවීන්ට මෙන්ම අදාළ රජයේ නිළධාරීන්ටද ගැටලුවක් වී තිබේ.

• ප්‍රදේශයේ කුඹුරු ඉඩම් වල වී වගාව සිදු කරන අතර කුඹුරු මධ්‍යයේ ඇති ඕවිටි ඉඩම් වල කෙටි කාලීන භෝග වගාව සිදු කරනු ලැබේ.ඊට අමතරව අල භෝග වගා කරන ඉඩම් කට්ටි කීපයක්ද තිබේ.අන්නාසි ,කෙසෙල් වැනි පලතුරු වගාවන්ගේ නිරත ගොවි මහතුන්ද හඳුනා ගත හැක.ප්‍රධාන අපනයනය භෝගයක් වන රබර් ඉඩම් කැබලි කීපයක්ද හඳුනා ගත හැකි අතර ඒවාගේ ආදායම් උත්පාදනයක් මේ වන විට සිදු වන බව දක්නට නොලැබේ.මීට අමතරව සුලු අපනයනය භෝග වන ගම්මිරිස් සහ කුරුඳු වගාවන් සහිත ඉඩම්ද හඳුනා ගත හැකිය.

• ගමේ සැලකිය යුතු පිරිසක් කෘෂිකාර්මික ජීවන රටාවකට හිමිකම් කියන අතර සත්ත්ව පාලනයේ නිරත පවුල් කිහිපයක්ද හඳුනා ගත හැකිය.වැඩිහිටි පරම්පරාව මේ සඳහා යොමු වී සිටියද තරුණ පරම්පරාව කෘෂි කර්මාන්තයෙන් සහ සත්ත්ව පාලනය සඳහා දක්වන දායකත්වය ඉතා අඩු බව පෙනී යයි.හොරතුඩුව ග්‍රාම නිළධාරී වසමට පොදු ස්ථානයක් ලෙස ඇත්තේ එක් ප්‍රජා ශාලාවක් පමණි.පොදු ක්‍රීඩා පිටියක් පැවතියත් එය වල් බිහි වී තිබේ.මීට අමතරව පන්සලක්,පාසලක්,සේවා පියස,පෙර පාසලක් යන කිසිවක් වසම තුළ නොමැත.

• වසමේ ජනතාවගෙන් කොටසක් රජයේ හෝ පෞද්ගලික අංශයේ ඉහළ තනතුරු දරන අය වේ.ඉතා දිළිඳු තත්වයෙන් ජීවත් වන පවුල් කීපයක්ද පවතින අතර ඔවුන්ට රජයේ ආධාර හිමිවේ.තමන්ගේ ම ආර්ථික කටයුත්තක හෝ ස්වයං රැකියාවක නිරත ජන කොටසක්ද ජීවත් වේ.

• ගමේ ජීවත් වන ජනතාවට ප්‍රවාහන පහසුකම් පිළිබඳ ගැටලු නොමැත.ගම මැදින් දිව යන 120 හොරණ කොළඹ ප්‍රධාන මාර්ගයේ නිතරම බස් රථ ධාවනය වන නිසා ගම් වැසියන්ට ප්‍රවාහනය පිළිබඳ ගැටලු නොමැත.342 කොට්ටාව,127 මොරගාහේන,149 හෝමාගම,120 හොරණ ආදී ඕනෑම බස් රථයක ගමන් කරමින් මෙම ගමේ ජනතාවට ප්‍රවාහන පහසුකම් සලසා ගත හැකිය.

• ගමේ ජනතාවට ආගමික කටයුතු සිදු කරගැනීමට ගමට අයත් විහාරස්ථානයක් නොමැති අතර හල්පිට ජනශක්තිපුර විහාරස්ථානය හා පොල්ගස්ඕවිට ශ්‍රී සුදර්ශනාරාමය යන විහාරස්ථානයේ ඒ සඳහා තෝරා ගෙන තිබේ.

• තවද වසමට අදාළව සුපිරි වෙළෙඳ සැලක් හා දයාරත්න ස්ටෝර්ස් නමින් තොග වෙළෙඳ සැලක් තිබේ.මීට අමතරව හල්පිට වයින් ස්ටෝර්ස් ආයතනයද වසම තුළ පවතින වැදගත් ස්ථානයක් ලෙස හඳුනා ගත හැකි විය.

• විශාල ඉඩම් හිමි පාරම්පරික මුල් පදිංචි කරුවන් පිරිසක් වසම තුළ ජීවත් වේ.ඉඩම් කට්ටි වෙන්දේසි වීම මත අලුත් පදිංචි කරුවන් විශාල පිරිසක් වසමේ පදිංචි කරුවන් බවට පත් වී තිබේ.

•කිසිදු ප්‍රයෝජනයට නොගත් ඌන පරිහරණ ඉඩම් කට්ටි කීපයක්ද වසම තුළ හඳුනා ගත හැකි අතර ඒවා ඩෙංගු උවදුරටද තර්ජනයක් වී තිබේ.මාර්ග පිළිබඳව සඳහන් කිරීමේදී සංවර්ධනය කල යුතු මාර්ග කීපයක් හරස්කඩ චාරිකාවේදී හඳුනා ගත හැකි විය.

## 5. වසමේ ඓතිහාසික සහ සංස්කෘතික පසුබිම - Historical and Cultural Background of GN Division

**• හොරතුඩුව කෝදූරාව යනු ගම්මාන දෙකකි.කෝදූරාව යන නම ලැබී ඇත්තේ අතීතයේ මෙම ප්‍රදේශයේ අක්කර 7 යුක්ත කෝදූරු වැව නමින් වැවක් දෙල්ගහවත්ත ප්‍රදේශයට පහලින් පැවති ඇත.නමුත් එම වැව ක්‍රි.ව 1800 ගණන් වලින් පසුව විනාශ වී ඇති බව හෙළිවේ.පසු කාලීනව එම ප්‍රදේශය වැවේ ඕවිට නමින් හඳුන්වා ඇත.කෙසේවුවත් පසුකාලීනව කෝදූරු වැව යන්න විකාශනය වී කෝදූරාව බවට පත්වී දැනට එම ප්‍රදේශය කෝදූරාව නමින් හඳුන්වන බව ගම්වැසියන්ගේ අදහසයි.**


**• හොරතුඩුව ගමට නම ලැබී ඇත්තේ ඈත අතීතයේ මෙම**

**ප්‍රදේශයම වෙලා ගත් හොර ගස් තිබී ඇත.විශාල ප්‍රමාණයෙන් හොරගස් තිබීම හේතුවෙන් හොරෙන්තුඩුව ලෙස හඳුන්වා ඇත.එය ක්‍රමයෙන් විකාශනය වී වර්තමානය වන විට හොරතුඩුව යන නමින් හඳුන්වයි.**

## 6. වසමේ සාමාන්‍යය කාලගුණික සහ දේශගුණික තත්ත්වය - Weather and Limatic Condition

| සංරචකය - Indicator | ජන: Jan | පෙබ: Feb | මාර්තු Mar | අප්‍රේල් Apr | මැයි May | ජූනි June | ජූලි July | අගෝ Aug | සැප්: Sep | ඔක්: Oct | නොවැ Nov | දෙසැ: Dec |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂාව- Rainfall (mm) | ✓ | ✓ | | | ✓ | ✓ | | | | ✓ | ✓ | |
| උෂ්ණත්වය- Temperature (Centigrade) | | | ✓ | ✓ | | | ✓ | ✓ | ✓ | | | ✓ |

**7. වසමේ සම්පත් සිතියම - Resource Map**



## 8. භූමි පරිභෝජනය - Land Use

| | භූමි පරිභෝජනය - Land Use | භූමි ප්‍රමාණය (හෙක්ටයාර්) (ha) |
|---|---|---|
| 1 | ප්‍රධාන වැවිලි – Main Crop | 2.67 |
| 2 | සුළු අපනයන බෝග – Minor Export Crops | |
| 3 | වී වගාව - Paddy Cultivation<br>වගා කරන - Cultivating Land<br>පුරන් කුඹුරු - Abandoned Land | 28<br>20.89<br>7.11 |
| 4 | වෙනත් කාලීන බෝග වගාව (1,2 සඳහා අයත් නොවන) - Seasonal Crops Exept 1 & 2 | 2.22 |
| 5 | ගෙවතු වගාව - Home Gardens | 0.89 |
| 6 | මිශ්‍ර භෝග - Mix Crops | 0.44 |
| 7 | ජලයෙන් යටවූ බිම් (වැව්, ජලාශ, වාරි මාර්ග, ගංගා) – Water Land (Lake, Resevoirs, Irrigation , Rivers) | 0.22 |
| 8 | රජයේ ඉඩම් - Crown Land<br>දැනට භාවිත කරන - Used<br>දැනට භාවිත නොකරන - Unused<br>නොකරන නමුත් වගා කිරීමට සුදුසු - Unused but Cultivatable Lands | 0.22 |
| 9 | ගල්/ වගුරු සහිත හා මුඩු බිම් - Bare Land | - |
| 10 | මාර්ග - Road (Km) | 1.11 |
| 11 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් - Buildings and Constructions (ව.කි) | 10.22 |
| 12 | ස්වභාවික කැලෑ - Natural Forest | - |
| 13 | වෙනත්- Others | - |
| **එකතුව - Total** | | **46** |

## 9. වසමේ සමාජ පසුබිම් විශ්ලේෂණය - Social Background of the GN Division

| වසමේ මුළු ජනගහනය - Total Population in GN Division | වසමේ මුළු පවුල් ගණන - Total Families in GN Division | වසමේ ලියාපදිංචි මුළු ඡන්ද දායකයින් සංඛ්‍යාව - Total Registerd Voters in GN Division | වසමේ පදිංචි මුළු ඡන්ද දායකයින් සංඛ්‍යාව - Total Voters Live in GN Division | වසමේ මුළු නිවාස ගණන - Total Houses in GN Division | වසමේ මුළු භූමි ප්‍රමාණය (ව.කිමී.) - Total Land Area in GN Division (Sq.km) |
|---|---|---|---|---|---|
| | | | | | |
| 1940 | 490 | 1419 | 1369 | 480 | 0.46 |
| | | | | | |
| | | | | | |
| | | | | | |

## 9.1 ජාතීන් අනුව ජන සංයුතිය - Ethnicity

| | සිංහල - Sinhala | ද්‍රවිඩ - Tamil | මුස්ලිම් - Muslims | වෙනත්- Other | මුළු එකතුව - Grand Total |
|---|---|---|---|---|---|
| ස්ත්‍රී - Female | 1025 | 6 | 5 | 2 | 1038 |
| පුරුෂ- Male | 878 | 9 | 7 | 8 | 902 |
| එකතුව- Total | 1903 | 15 | 12 | 10 | 1940 |

## 9.2 ආගම අනුව ජන සංයුතිය - Religious

| | ජනගහනය - Population |
|---|---|
| බුද්ධාගමික - Buddhist | 1888 |
| හින්දු - Hindu | 13 |
| ඉස්ලාම් - Islam | 12 |
| කතෝලික - Catholic | 25 |
| වෙනත් - Others | 02 |

### 9.3 වයස් කාණ්ඩ - Age Groups

| අනු අංකය No | වයස් කාණ්ඩය - Age Catogery | ස්ත්‍රී පුරුෂභාවය - Gender | | එකතුව - Total |
|---|---|---|---|---|
| | | ස්ත්‍රී - Female | පුරුෂ - Male | |
| 1 | අවුරුදු 0 -5 / Age 0 -5 | **50** | **57** | **107** |
| 2 | අවුරුදු 6 -10 /Age 6 -10 | **25** | **18** | **43** |
| 3 | අවුරුදු 11-17 /Age 11-17 | **35** | **43** | **78** |
| 4 | අවුරුදු 18-29 / Age 18-29 | **102** | **112** | **214** |
| 5 | අවුරුදු 30-45/ Age 30-45 | **420** | **453** | **873** |
| 6 | අවුරුදු 46-59 /Age 46-59 | **270** | **244** | **570** |
| 7 | අවුරුදු 60-69 / Age 60-69 | **31** | **43** | **74** |
| 8 | අවුරුදු 70-99/ Age 70-99 | **16** | **21** | **37** |
| 9 | අවුරුදු 100 හා වැඩි / Age Over 100 | | | |
| | මුළු එකතුව | **949** | **991** | **1940** |

### 9.4 සේවා නියුක්තියේ ස්වභාවය (විදේශ රැකියාවල නියුක්ති අයද ඇතුළත්ව) - Nature of the Employability (Including Foreign Employees)

| සේවා නියුක්ත ජනගහනය- Employed Population | | සේවා වියුක්ත ජනගහනය Unemployed Population | | එකුතව - Total |
|---|---|---|---|---|
| ස්ත්‍රී - Female | පුරුෂ - Male | ස්ත්‍රී - Female | පුරුෂ - Male | |
| 310 | 331 | 106 | 77 | 824 |

**9.5 අංශ අනුව සේවා නියුක්තිය - Employment as per the Sectors**

| අනු අංකය - S.No | අංශය - Sector | ස්ත්‍රී - Female | පුරුෂ - Male | එකතුව - Total |
|---|---|---|---|---|
| 1 | රාජ්‍ය/පළාත් රාජ්‍ය - Govt./Local Government | 26 | 20 | 46 |
| 2 | අර්ධ රාජ්‍ය - Semi Government | 23 | 18 | 41 |
| 3 | පෞද්ගලික අංශය - Private Sector | 80 | 100 | 180 |
| 4 | ස්වයං රැකියා - Self Employment | 22 | 34 | 56 |
| 5 | විදේශ සේවා නියුක්තිය - Foreign Employment | 08 | 15 | 23 |
| 6 | වෙනත්- Others | 20 | 60 | 80 |
| | එකතුව- Total | 179 | 247 | 256 |

**9.6 අස්වැසුම හා රජයේ සහනාධාරලාභී පවුල් වර්ගීකරණය - Aswesuma and Government Subsidy Receipient Families**

| අස්වැසුම ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව - No. of Aswasuma Families | | | රජයේ වෙනත් සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව (වැඩිහිටි දීමනාව / රෝගාධාර / මහජනාධාර යනාදී) - No. of Families Receiving Government Subsidies (Elders Allowance/Medical Aids/Public Assistance, etc….) |
|---|---|---|---|
| අන්ත දිළිඳු - Severely Poor | දිළිඳු - Poor | සංක්‍රාන්තික සහ ආන්තික - Transitional and Vulnerable | |
| 03 | 03 | 13 | 23 |

**9.7 විශේෂ අවධානය යොමු කළ යුතු පවුල් සංඛ්‍යාව - Marginalized and Vulnerable Families**

| කාන්තා මූලික පවුල් සංඛ්‍යාව - No. of Women Headed Families | තනි මාපිය පවුල් සංඛ්‍යාව - No. of Single Parent Families | ආබාධිත පවුල් සංඛ්‍යාව - No. of Families with Disabled |
|---|---|---|
| 10 | 05 | 07 |

### 9.8 මාසික ගෘහස්ථ ආදායම් රටාව - Monthly Domestic Income Pattern

| මාසික ආදායම - Monthly Income | රු. 15000 හෝ ඊට අඩු - Rs.15000 or Below | රු. 15001-30000 | රු. 30001-45000 | රු. 45001-60000 | රු. 60001-75000 | රු. 75001-100000 | රු. 100000 ට වැඩි - Rs.100000 or Above |
|---|---|---|---|---|---|---|---|
| පවුල් සංඛ්‍යාව - No of Families | 31 | 27 | 73 | 97 | 110 | 102 | 50 |

### 9.9 මාසික ගෘහස්ථ වියදම් රටාව - Monthly Domestic Expenditure Pattern

| මාසික වියදම - Monthly Expenditure | රු. 15000 හෝ ඊට අඩු - Rs.15000 or Below | රු. 15001-30000 | රු. 30001-45000 | රු. 45001-60000 | රු. 60001-75000 | රු. 75001-100000 | රු 100000 ට වැඩි - Rs.100000 or Above |
|---|---|---|---|---|---|---|---|
| පවුල් සංඛ්‍යාව - No of Family | 31 | 27 | 73 | 97 | 110 | 102 | 50 |

## 10. වසමේ මූලික පහසුකම් හා පොදු පහසුකම් පිළිබඳ තොරතුරු - Basic Facilities and Common Facilities in GN Division

### 10.1 නිවාස පහසුකම් අනුව පවුල් සංඛ්‍යාව - Categarization of Families with Housing Facilities

| ස්ථිර නිවාස - Permenent Houses | අර්ධ ස්ථිර නිවාස - Semi Permenent Houses | තාවකාලික නිවාස - Temporay Houses | වතු තනි නිවාස - Estate Single Houses | වතු ලයින් කාමර - Estate Lines | කුලී හා බදු පදනම මත - Rent and Lease | නිවාස නොමැති - Homeless |
|---|---|---|---|---|---|---|
| **404** | **-** | **01** | **-** | **-** | **75** | **-** |

## 10.2 සනීපාරක්ෂක පහසුකම් අනුව පවුල් සංඛ්‍යාව - Categarization of Families with Sanitary Facilities

| ජල මුද්‍රිත වැසිකිළි - Water Sealed | වල වැසිකිළි - Not Water Sealed | පොදු වැසිකිළි - Common Toilets | තාවකාලික වැසිකිළි - Temporay Toilets | වැසිකිළි නොමැති - Not using a Toilet |
|---|---|---|---|---|
| **479** | **-** | **-** | **-** | **01** |

## 10.3 පානීය ජල පහසුකම් - Drinking Water facilities

| ප්‍රධාන මූලාශ්‍රය - Main Source | නිවාස සංඛ්‍යාව - No of Houses | පවුල් සංඛ්‍යාව - No of Families | රජයේ කාර්යාල - Government Office | ව්‍යාපාරික ස්ථාන - Commercial | කර්මාන්ත- Factory | පාසැල් - Schools | ආගමික මධ්‍යස්ථාන - Religious Places | වෙනත්- Others |
|---|---|---|---|---|---|---|---|---|
| තමාගේම ආරක්ෂිත ළිඳක් මගින් ජලය සපයා ගන්නා - Protected Well in Own House | 100 | 105 | | | | | | |
| තමාගේම අනාරක්ෂිත ළිඳක් මගින් ජලය සපයා ගන්නා - Unprotected Well in Own House | | | | | | | | |
| තමාගේම නළ ළිඳක් මගින් ජලය සපයා ගන්නා - Tube Well in Own House | 02 | 02 | | | | | | |
| ජල සම්පාදන මණ්ඩලය මගින් ජලය සපයා ගන්නා - Pipe Born Water | 378 | 383 | | | | | | |
| ප්‍රජා ජල ව්‍යාපෘති මගින් ජලය සපයා ගන්නා - Community Based Water Projects | - | - | - | - | - | - | - | - |
| ඇල, දොළ,ජල පිහිලි ස්වභාවික ජල උල්පත්, වැව් මගින් ජලය සපයා ගන්නා - Natural Water Streames | - | - | - | - | - | - | - | - |
| වැසි ජල ටැංකි මගින් ජලය සපයා ගන්නා - Rain Water | - | - | - | - | - | - | - | - |
| වෙනත් (සඳහන් කරන්න) - Others (Mention) | - | - | - | - | - | - | - | - |

## 10.4 විදුලි පහසුකම් - Electricity

| ප්‍රධාන මූලාශ්‍රය - Main Source | නිවාස සංඛ්‍යාව - No of Houses | පවුල් සංඛ්‍යාව - No of Families | රජයේ කාර්යාල - Government Office | ව්‍යාපාරික ස්ථාන - Commercial | කර්මාන්ත- Factory | පාසැල් - Schools | ආගමික මධ්‍යස්ථාන - Religious | වෙනත්- Others |
|---|---|---|---|---|---|---|---|---|
| විදුලිබල මණ්ඩලය/ ලංකා විදුලි පෞද්ගලික සමාගම මගින් විදුලිය ලබා ගන්නා (Ceylon Electricity Board & LECO) | 474 | 485 | 01 | 30 | 04 | | | |
| සූර්ය කෝෂ මගින් විදුලිය ලබා ගන්නා- Solar Pannel | 10 | 10 | | | | | | |
| ජීව වායු මගින් විදුලිය ලබා ගන්නා - Bio Gass | | | | | | | | |
| කිසිදු ක්‍රමයකින් විදුලිය ලබා නොගන්නා (විදුලිය නොමැති) – No Electricity | 01 | | | | | | | |

## 10.5. විදුලි සංදේශ පහසුකම් - Telecomunication

| අංශය - Sector | සම්බන්ධතා සංඛ්‍යාව - No of Connections | දුරකතන - Telephone | | ෆැක්ස් - Fax | ඊමේල් - E mail | අන්තර් ජාල - Internet |
|---|---|---|---|---|---|---|
| | | ස්ථාවර- Land | ජංගම- Mobile | | | |
| රාජ්‍ය - Government | | | | | | |
| අර්ධ රාජ්‍ය - Semi Government | | | | | | |
| පෞද්ගලික (නිවාස)- Domestic | 420 | 210 | 1200 | 800 | 750 | 127 |
| පෞද්ගලික (ව්‍යාපාරික ස්ථාන) – Private Sector | 15 | 10 | 30 | 5 | 15 | 12 |
| වෙනත්- Others | | | | | | |
| එකතුව- Total | 436 | 220 | 1230 | 805 | 765 | 139 |

## 10.6 මාර්ග පිළිබඳ තොරතුරු - Roads

| අනු අංකය No | මාර්ගයේ නම සහ දුර - Name & the Length of Road (km) | මාර්ග වර්ගය- Grade (A,B,C,D,E) | සංවර්ධනය කර ඇති දුර කි.මී. - Length Developed Km |
|---|---|---|---|
| 01 | 120 කොළඹ හොරණ පාර | B | 1.5Km |

## 10.7 අධ්‍යාපන පහසුකම් - Educational Facilities

<table>
<tr><th colspan="4">රජයේ පාසල් සංඛ්‍යාව - No. of Govemnet Schools</th><th rowspan="3">රජයේ අනුමත පෞද්ගලික පාසැල් සංඛ්‍යාව (1-13/ 6-13) - No. of Grovernment Approved Private Schools</th><th colspan="3">පෞද්ගලික පාසල් සංඛ්‍යාව - No.of Private Schools</th><th rowspan="3">පිරිවෙන් සංඛ්‍යාව - No of Piriven</th><th rowspan="3">විශේෂිත පාසැල් සංඛ්‍යාව -No. of Special Schools</th><th rowspan="3">උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව - No.of Higher Educational Institute</th><th rowspan="3">වෘත්තීය අධ්‍යාපන ආයතන සංඛ්‍යාව - No. of Vocational Education Institute</th><th rowspan="3">පෙර පාසැල් සංඛ්‍යාව - No. of Pre Schools</th><th rowspan="3">දහම් පාසැල් - No. of Daham Schools</th></tr>
<tr><th rowspan="2">1-5</th><th rowspan="2">1-11/ 1-8 / 6-11</th><th colspan="2">1-13 / 6-13</th><th rowspan="2">1-5</th><th rowspan="2">1 - 11 / 6-11</th><th rowspan="2">1-13</th></tr>
<tr><th>ජාතික - National</th><th>පළාත- Provincial</th></tr>
<tr><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td></tr>
</table>

### 10.8 සෞඛ්‍ය සේවා පහසුකම් - Healh Facilities

| වර්ගය - Category | සංඛ්‍යාව - Numbers |
|---|---|
| ශික්ෂණ රෝහල් - Teaching Hospital | - |
| මූලික රෝහල්- Base Hospital | - |
| දිස්ත්‍රික් රෝහල් - District Hospital | - |
| ග්‍රාමීය රෝහල් - Rural Hospital | - |
| සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය- MOH | - |
| රජයේ සායන මධ්‍යස්ථාන - Govt.Clinic Centers | - |
| ආයුර්වේද බෙහෙත්ශාලා - Aurvadic Centers | - |
| මධ්‍යම බෙහෙත් ශාලා - Central Dispenceries | - |
| පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන -Private Medical Centers | - |
| වෙනත් (සඳහන් කරන්න)- Others (Specify) | - |

### 10.9 වෙළෙඳපොල පහසුකම් - Market Facilities

| වර්ගය - Category | සංඛ්‍යාව - Number |
|---|---|
| සතිපොළ - Fair | - |
| සතොස - Sathosa | - |
| සමුපකාර - Cooparatives | - |
| සුපිරි වෙළඳසැල් - Super Market | 2 |
| පොදු වෙළඳ සංකීර්ණ - Central Market | - |
| ආර්ථික මධ්‍යස්ථාන - Economic Centers | - |
| වෙනත් (සඳහන් කරන්න) - Others (Mention) | - |

### 10.10 පොදු ප්‍රවාහන පහසුකම් සපයා ගන්නා ආකාරය - Mode of Public Transport Facilities

**( √ ලකුණ යොදන්න / Mark √ )**

| ප්‍රවාහන මාධ්‍යය - Mode of Tranportation | බස් රථ - Buses | දුම්රිය - Trains | වෙනත් පොදු ප්‍රවාහන සේවා - Other Public Transport Facilities |
|---|---|---|---|
| ප්‍රමාණවත්ව ඇත - Sufficiently Available | √ | | |
| ප්‍රමාණවත්ව නැත - Not Sufficiently Available | | | |
| නැත - Not Available | | | |


**11.** **දැනට භාවිතා නොකරන නමුත් භාවිතයට ගතහැකි රජයේ සහ පෞද්ගලික ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර හා වෙනත් සම්පත් ( පවතීනම්) – Unused but usable Government & Private Resources such as Buildings, Machinaries and Others (Available)**

| අයිතමය -Item | අයිතිය - Ownership | | පෙර භාවිතයේ ස්වභාවය - Previous Usage |
|---|---|---|---|
| | රජයේ - Government | පෞද්ගලික- Private | |
| | - | - | - |
| | | | |

**12.** **වසමේ පවතින ප්‍රජා සංවිධාන හා ආයතන - CBOs in GN Division**

| | ප්‍රජා සංවිධානය/ආයතනයේ නම - Name of the CBO/ Institute | සේවාව - Services |
|---|---|---|
| 01. | තුසිත ජොෂ්ය පුරවැසි සමිතිය | වැඩිහිටි ප්‍රජාව සංවර්ධනය කිරීම |
| 02. | ප්‍රජාපති කාන්තා සමිතිය | කාන්කාවන් දිරිගැන්වීම මඟින් ආර්ථික තත්වය ඉහළ නැංවීමට දිරි ගැන්වීම |
| 03. | ළමා සමිතිය | ළමයින්ගේ දැනුම කුසලතා වර්ධනය කිරීම |
| 04 | සුභ සාධක හා අවමංගල්‍යයාධාර සමිතිය | ගම්වැසියන්ගේ අවමංගල්‍යය හා සුභ සාධක කටයුතු සඳහා |
| 05 | එක්සත් ගොවි සංවිධානය | කෘෂිකාර්මාන්තයේ යෙදී සිටින ගොවීන්ගේ සුභ සාධනය සඳහා |
| 06 | එක්සත් කාන්තා ගොවි සංවිධානය | ගෙවිතු වගාවේ නිරත කාන්තාවන්ගේ සුභ සාධනය සඳහා |
| 07 | කප් රුක සුභ සාධක සංගමය | මල්කැකුණලන්ද ප්‍රදේශයේ ජනතාවගේ සුභ සාධන කටයුතු වෙනුවෙන් |

**13.සමාජ සිතියම- Social Map**



## 14 . ප්‍රමුඛතාගත කළ සංවර්ධන යෝජනා - Prioritised Development Proposals

**එක් එක් ක්ෂේත්‍ර අනුව හඳුනාගනු ලබන සංවර්ධන යෝජනා සමස්තයක් වශයෙන් ප්‍රමුඛතාවය අනුව පෙළගස්වා ප්‍රමුඛතා අංකය යෙදිය යුතුය. - All the Development proposals identified for each sector should be prioritized and ranked as a whole.**

### 14.1 යටිතල පහසුකම් සංවර්ධනය යෝජනා (විදුලිය, පානිය ජලය, නිවාස, සනීපාරක්ෂක පහසුකම්, ප්‍රවේශ මාර්ග, වාරිමාර්ග යනාදී) - Infrastructure Development Proposals ( Electricity, Drinking Water, Housing, Sanitory Facilities, Roads, Irrigation etc.)

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | හොරතුඩුව ග්‍රාම නිළධාරී වසමට අයත් වටමාවත Nsk Car සේල් ආයතනය අසල සිට අතුරු මාර්ගද ඇතුළත්ව. කාණු පද්ධති සමග සුදුසු පරිදි සංවර්ධනය කිරීම.(කාපට් කිරීම ) | 01 | ලක්ෂ 200 පමණ | පවුල් 250 |
| 02 | මල්කැකුණලන්ද ලන්ද මාවත (120 මාර්ගය අසල සිට) කාණු පද්ධතිය සමග සංවර්ධනය කිරීම.(කාපට් කිරීම ) | 05 | ලක්ෂ 50 | පවුල් 45 |
| 03 | ඉදල්ගස්වත්ත මාර්ගය (120 මාර්ගය අසල සිට) කාණු පද්ධතිය සමග සුදුසු පරිදි සංවර්ධනය කිරීම. (කාපට් කිරීම) | 06 | ලක්ෂ 75 | පවුල් 50 |
| 04 | අඹගහවත්ත මාර්ගය 16/03 මොහොමඩ් ෆසිල් ෆවුස් මහතාගේ නිවස අසල සිට 120 මාර්ගය දෙසට කාණු පද්ධතිය සමග සුදුසු පරිදි සංවර්ධනය කිරීම . | 07 | ලක්ෂ 30 | සෘජු ප්‍රතිලාභීන් 15<br>වක්‍ර ප්‍රතිලාභීන් 500 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමේ සිසිල මාවත නො. 68/A/3 නිවස අසල සිට ඉදිරියට කාණු පද්ධතිය සමග සංවර්ධනය කිරීම . | 08 | ලක්‍ෂ 75 | පවුල් 150 |
| 06 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමේ 120 මාර්ගයේ නො.43/ A මහේෂ් මහතාගේ නිවස අසල සිට ඉදිරියට මීටර 150 පමණ දුරට කාණු පද්ධතිය සංවර්ධනය කිරීම. | 09 | ලක්‍ෂ 10 | 120 මාර්ගය භාවිතා කරන්නන් |
| 07 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමේ කන්නන්ගර මාවත නො 35/F/1 නිවස අසල සිට නො 35 නිවස දක්වා සංවර්ධනය කිරීම. | 10 | ලක්‍ෂ 10 | |
| 08 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමේ ඉදල්ගස්වත්ත මාර්ගායේ දෙවන පටුමග නො 39/1/ A ආනන්ද මහතාගේ නිවස අසල සිට ඉදිරියට සුදුසු පරිදි සංවර්ධනය කිරීම . | 11 | ලක්‍ෂ 10 | |
| 09 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමේ කෝදුරාව දෙල්ගහවත්ත 1 වන පටුමග දෙපස සපත්තු කාණු යොදා සංවර්ධනය කිරීම . | 12 | ලක්‍ෂ 08 | |

## 14.2 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධන යෝජනා - Micro, Small and Medium Scaled Entreprenuership Development Proposals

### 14.2.1 නව ව්‍යවසායකත්ව සංවර්ධන යෝජනා - New Entreprenuership Development Proposals

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | විශේෂ හැකියාවන්ගෙන් සපිරි කාන්තාවන් හඳුනාගෙන ස්වයං රැකියා සඳහා යොමු කිරීමට විශේෂ පුහුණු වැඩසටහන් පැවැත්වීම | 22 | 10,000 | 10 |
| 02 | පුහුණු පාඨමාලාවන්ගෙන් අනතුරුව පුහුණු ලාභීන් හට ස්වයං රැකියා ආරම්භ කිරීමට ණය මුදල් හා උපකරණ ලබා දීමට කටයුතු කිරීම. | 23 | 00 | 10 |

### 14.2.2 දැනට පවතින ව්‍යවසායකත්ව සංවර්ධන යෝජනා - Existing Entreprenuership Development Proposals

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | වෘත්තිකයින් හට අවශ්‍ය නිෂ්පාදන ධාරිතාවය පුළුල් කර ගැනීම සඳහා නව තාක්ෂණික භාවිතය පිළිබඳව පුහුණු වැඩසටහන් හරහා දැනුම ලබා දීමට කටයුතු කිරීම. | 24 | 10,000 | 05 |
| 02 | රැකියා වෙළඳපොළ පැවැත්වීම හරහා සේවා නියුක්තිය වර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම. | 25 | 00 | 25 |
| 03 | අලෙවිකරණයට අවශ්‍ය දැනුම ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | | | |

**14.3 විකල්ප ආදායම් ව්‍යාපෘති යෝජනා - Alternative Income Generating Project Proposa**

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | ගෘහනියන් ස්වයං රැකියාවලට යොමු කිරීමට අවශ්‍ය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 26 | 10,000 | 10 |
| 02 | කාන්තාවන් සඳහා Online තාක්ෂණය මඟින් දත්ත ඇතුලත් කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දීමට අවශ්‍ය පුහුණුව ලබා දීම. | 27 | 10,000 | 15 |
| 03 | කාන්තාවන් සඳහා ඇඳුම් මැසීමේ පාඨමාලා පැවැත්වීම | 28 | 5000 | 10 |

**14.4 නිපුණතා හා ධාරිතා සංවර්ධන යෝජනා - Skill and Capasity Development Proposals**

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | වෘත්තිය පුහුණු අපේක්ෂිත පුද්ගලයින් වෘත්තිය පුහුණු සඳහා යොමු කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරිම. | 21 | 10000 | 10 |
| 02 | සමෘද්ධි පවුල් නගා සිටුවීම සඳහා ස්වයං රැකියා පුහුණුව ලබා දීම හා ආරම්භ කිරීමට ණය පහසුකම් ලබා දීම | 20 | ලක්ෂ 5 | 20 |

## 14.5 සමාජ සංවර්ධන යෝජනා - Social Development Proposals

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | හොරතුඩුව ග්‍රාම නිළධාරී වසමේ මල්කැකුණලන්ද පොදු කටයුතු සඳහා වෙන් කර ඇති භූමිය ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කර (ඇවිදීමේ මංතීරුවක් සමග) ළමා හා වැඩිහිටි ප්‍රජාවගේ සුභ සාධනය සඳහා ලබා දීම.(නගර සභාවට අයත්) | 03 | ලක්ෂ 50 | සියලු ග්‍රාමීය ප්‍රජාව |
| 02 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමේ මල්කැකුණලන්ද ප්‍රදේශයේ ඇති භූමියේ (කැස්බෑව නගර සභාවට අයත්) ඉතිරි කොටසේ සේවා පියසක් ඉදි කිරීම. | 02 | ලක්ෂ 50 | වසමේ ප්‍රජාව හා රාජ්‍ය නිළධාරීන් |
| 03 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමේ සුභ සාධක හා අවමංගල්‍යයාධාර ගොඩනැගිල්ල ඉහළ මහල සමග සංවර්ධනය කර සියලු ස්වෙච්ඡා සංවිධාන සඳහා රැස්වීම හා උත්සව පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා දීම. (සභාවට අයත්) | 04 | ලක්ෂ 75 | වසමේ ස්වෙච්ඡා සංවිධාන සාමාජිකයන් |
| 04 | හොරතුඩුව ග්‍රාම නිළධාරී වසමේ තුසිත වැඩිහිටි සමිතියේ ලිපි ලේඛන හා භාණ්ඩ ගබඩා කර තබා ගැනීම සඳහා වානේ අල්මාරියක් ලබා දීම.(අඩි 6 උස පළල අඩි 4) | 18 | 50000 | 60 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමේ කප් රුක සුභ සාධක සංගමයේ සුභ සාධක කටයුතු වෙනුවෙන් අඩු පාඩුවත්ව පවතින (20 " × 15 ") ප්‍රමාණයේ කැනපි එකක් ලබා දීම. | 13 | 25000 | සාමාජිකයන් 25 |
| 06 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමේ එක්සත් කාන්තා ගොවි සංවිධානයේ සාමාජිකාවන්ට මාසික රැස්වීම් පැවැත්වීම සඳහා පුටු ලබා දීම. | 14 | 25000 | ප්‍රතිලාභීන් 45 |
| 07 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමේ කෝදුරාව / හොරතුඩුව එක්සත් ගොවි සංවිධානයේ සාමාජිකයන්ගේ කෘෂිකාර්මික කටයුතු සඳහා A.K 75 කොබෝටා වර්ගයේ ට්‍රැක්ටරයක් ලබා දී සී සෑම සඳහා වියදම් වන මුදල අවම කර ගොවි මහතුන්ට සවියක් වීම. | 15 | ලක්ෂ 50 | ප්‍රතිලාභීන් 45 |

## 14.6 පරිසර සංරක්ෂණ ව්‍යාපෘති යෝජනා - Environmental Protection Project Proposals

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | කැලි කසල බැහැර කිරීම පිළිබඳ වීදි කම්වු මගින් හා ශබ්ද විකාශන මඟින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | 18 | රු 10,000 | 300 |
| 02 | වීදි කම්වු සක්‍රීය කිරීම මඟින් අවිධිමත් කසල බැහැර කිරීම් විධිමත් කිරීමට කටයුතු කිරීම සඳහා වැඩසටහන් පැවැත්වීම. | 19 | රු 10,000 | 400 |

## 14.7 වෙනත් සංවර්ධන යෝජනා (අධ්‍යාපන, සෞඛ්‍ය, කෘෂිකර්ම, ධීවර, වැවිලි, කර්මාන්ත, සේවා යනාදී) - Other Development Proposals (Education, Health, Agriculture, Fisheries, Plantation, Industry, Services etc.)

| අනු අංකය- S.No. | යෝජනාව - Proposal | ප්‍රමුඛතාගත අංකය - Priority No. | දළ ඇස්තමේන්තුගත මුදල - Tentative Estimate (Rs.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව - No.of Beneficiaries |
|---|---|---|---|---|
| 01 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමට අයත් ස්වර්ණ පෙදෙස කෙළවර සර්වෝදය මාවත දක්වා සිට ඇළේ පැති බැම්ම ඉතිරි කොටස ඉදි කිරීම. | 17 | ලක්ෂ 10 | 25 |
| 02 | හොරතුඩුව ග්‍රාම නිළධාරි වසමේ කුඹුරු අක්කර 15 පමණ පුරන් කුඹුරුය.එම පුරන් කුඹුරු වල වෙල් ආත්තා ඉවත් කර ඇළවේලී සුද්ද කර වී වගාව සඳහා ගොවි මහතුන්ට ලබා දීම. | 16 | ලක්ෂ 50 | 22 |